# ලංසු කැඳවීමේ ආරාධනය

## රත්නපුර මහා නගර සභාව

පහත සඳහන් වැඩ විෂයන් රත්නපුර මහා නගර සභාවේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් කර්මාන්තවලට අදාළව, 2026.10.13 වන දින පෙ.ව. 11.00 දක්වා මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

| අනු අංකය | වැඩ විෂයය | දළ වැඩ වටිනාකම (රු.මි) | ආපසු නොගෙවන ලංසු ගාස්තු (රු) | ආපසු ගෙවන ලංසු සුරක්ෂණය (රු) | කොන්ත්‍රාත් ලියාපදිංචි වටිනාකම |
|---|---|---|---|---|---|
| **1.** | **අවමංගල්‍ය ශාලාව ඉදි කිරීම** | **63.96** | **14,000.00** | **650,000.00** | **$C_5$ ,$C_4$ ,$C_3$** |
| **2.** | **මහජන පොළ ඉදි කිරීම** | **250.70** | **40,000.00** | **2,600,000.00** | **$C_4$ සහ ඉහළ** |
| **3.** | **නව ගබඩා සංකීර්ණය ඉදි කිරීම** | **14.42** | **4,000.00** | **150,000.00** | **$C_7$ ,$C_6$ ,$C_5$** |

01. 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය මෙම ප්‍රසම්පාදන කටයුතු සඳහා අදාල වන අතර. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලැබේ.මෙම කර්මාන්තයන්ට අදාල CIDA ශ්‍රේණිගත ප්‍රමුඛතාවය හෝ සබරගමු පළාත් ඉදි කිරීම් කොන්ත්‍රාත් ලියාපදිංචිය පදනම් කර ගනිමින් ලංසුකරුවන් තෝරා ගැනීම සිදු කරනු ලබයි.

02. වැඩ විෂයන්ට අදාල ලංසුපත් **2026.09.21** දින සිට **2026.10.12** දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා ඉහත සඳහන් පරිදි ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු රත්නපුර මහා නගර සභා ගිණුම් අංශයට ගෙවා ලබා ගත යුතුය.

03. සියළුම ලංසුකරුවන් කර්මාන්තය ඉදිරියෙන් සදහන් ලංසු බැදුම්කර වටිනාකමට අදාලව ශ්‍රී ලංකා  මහ බැංකුව විසින් පිළිගත් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් ලංසු ලියකියවිලිවල සදහන් දින දක්වා වලංගු වන පරිදි **නාගරික කොමසාරිස්,රත්නපුර මහා නගර සභාව ,රත්නපුර** නමින් බැදුම්කරයක් හෝ රත්නපුර මහා නගර සභාවේ ගිණුම් අංශයට මුදල් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සි වල මුල් පිටපත් සමග ඉදිරිපත් කල යුතුය.

04. සාර්ථක ලංසුකරුවන්ට කොන්ත්‍රාත් පිරිනැමීම ඔවුන්ගේ ලියාපදිංචි වටිනාකමට සීමා කරනු ඇත.ලංසු සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් ප්‍රතික්ෂේප කිරීම හෝ භාර ගැනීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ***මුද්‍රා තබන ලද ලංසු, පිටපත් දෙකකින් යුතුව* 2026.10.13 වන දින පෙ.ව. 11.00 *ට හෝ ඊට පෙර  ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවීමට හෝ රත්නපුර මහා නගර සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තබා ඇති මුද්‍රා තබන ලද පෙට්ටියට*** ගෙනවිත් බහාලිමට හෝ හැකිය.  ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් බහාලන **කවරයේ ඉහල වම් කෙළවරේ, කර්මාන්තයේ නම සහ අංකය සදහන් කළ යුතුය**. සෑම කර්මාන්තයක් සඳහාම ඊට අදාළ අනුපිටපත වෙනම කවරයක බහා කවරයේ ඉහල වම් කෙළවරේ කර්මාන්තයේ අංකය, නම සහ අනුපිටපත ලෙස සඳහන් කර ඉදිරිපත් කල යුතුය.

06.**2026.10.13** වන දින **පෙ.ව. 11.30** ට රත්නපුර මහා නගර සභාවේ රැස්වීම් ශාලාවේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරු හෝ බලයලත් නියෝජිතයකුට සහභාගිවිය හැකිය.

07. මෙම කර්මාන්තය පිළිබඳ විස්තර රත්නපුර මහා නගර සභාව වෙත පැමිණ හෝ දුරකථන අංක 045-2222275 / 045-2223502 වෙතින් කාර්යාල වේලාවන් තුලදී ලබා ගත හැකිය.අවශ්‍ය අයෙකුට නොමිලේ සතියේ වැඩ කරන දිනයන්හීදී ලංසු ලේඛණ පරීක්ෂා කර බැලිය හැක.

08. සියළු කර්මාන්තයන්ට අදාලව පූර්ව ලංසු සාකච්ඡාව 2026.10.06 දින පෙ.ව.10.30 ට නාගරික කොමසාරිස්,රත්නපුර මහා නගර සභාව,රත්නපුර ,කාර්යාලයේදී පවත්වනු ලැබේ.ලංසුකරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

09.සියළුම ලංසු, ලංසු ලියකියවිලි වල සදහන් දින දක්වා වලංගු විය යුතුය.

10. ලංසුපත් සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති සතු වේ.

ප්‍රසම්පාදන කමිටු සභාපති,
රත්නපුර මහා නගර සභාව.
2026.09.14 දින,

# ලංසු කැඳවීමේ ආරාධනා

# රත්නපුර මහා නගර සභාව

රත්නපුර මහා නගර සභාවේ පහත කර්මාන්ත සඳහා සුදුසුකම් ඇති හා හැකියාව ඇති ලංසුකරුවන්ගෙන් රත්නපුර මහා නගර සභා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

- වැඩි විස්තර www.ratnapura.mc.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.
- මෙම කර්මාන්ත පිළිබඳ විස්තර රත්නපුර මහා නගර සභාව වෙත පැමිණ හෝ දුරකථන අංක 045-2222275/ 045-2223502 වෙතින් කාර්යාල වේලාවන් තුලදී ලබා ගත හැකිය.අවශ්‍ය අයෙකුට නොමිලේ සතියේ වැඩ කරන දිනයන්හිදී ලංසු ලේඛණ පරීක්ෂා කර බැලිය හැක.
- 2026.10.12 දින දක්වා ලංසුපත් නිකුත් කරනු ලැබේ.

| අනු අංකය | වැඩ විෂයය | දළ වැඩ වටිනාකම (රු.මි) | ආපසු නොගෙවන ලංසු ගාස්තු (රු) | ආපසු ගෙවන ලංසු සුරක්ෂණය (රු) | කොන්ත්‍රාත් ලියාපදිංචි වටිනාකම |
|---|---|---|---|---|---|
| 1. | අවමංගල්‍ය ශාලාව ඉදි කිරීම | 63.96 | 14,000.00 | 650,000.00 | $C_5$ ,$C_4$ ,$C_3$ |
| 2. | මහජන පොළ ඉදි කිරීම | 250.70 | 40,000.00 | 2,600,000.00 | $C_4$ සහ ඉහළ |
| 3. | නව ගබඩා සංකීර්ණය ඉදි කිරීම | 14.42 | 4,000.00 | 150,000.00 | $C_7$ ,$C_6$ ,$C_5$ |

ප්‍රසම්පාදන කමිටුව සභාපති,
රත්නපුර මහා නගර සභාව.

045-2223502

2026.09.14 දින